දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

| | | |
|---|---|---|
| අමාත්‍යතුමා<br>அமைச்சர்<br>Minister | } | 2784832<br>2784807<br>2785617 |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | } | 2784812 |
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | } | 2785141-50<br>Fax: 2784846 |

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................................

මගේ අංකය / எமது இல. / My No. } ඊඩී/2/29/10/21/31

දිනය / திகதி / Date } 2009.02. 27

චක්‍රලේඛ අංක: 2009/04

සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් වෙත.

## ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස්වීම

උක්ත කරුණ සම්බන්ධව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් මා ඇමතූ පී2/52/121(20006) අංකිත 2008.06.24 දිනැති ලිපියෙන් ප්‍රකාශිත කරුණු හා බැඳේ.

02. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජන රජයේ 1995.04.03 දිනැති 865/03 අංකිත අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය, අවස්ථා කිහිපයකදී සංශෝධනයට ලක්ව ඇති අතර එසේ සංශෝධිත ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූලව , එක් පන්තියක / ශ්‍රේණියක සිට ඊට ඉහළ පන්තියට / ශ්‍රේණියට, උසස්වීම් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා සිටින, හා අවශ්‍ය වන ලකුණු උපයාගෙන සිටින ගුරුවරයෙකු විසින් සපුරාගත යුතු අවශ්‍යතා කිහිපයක් පහත දක්වා ඇත.

(i) සේවාස්ථ පුහුණු වැඩ සටහන් සඳහා සහභාගිත්වය.
(ii) වෘත්තීය සමාලෝචනය සමත්වීම.
(iii) කඩඉම් විභාගය සමත් වීම.
(iv) නම් කළ නිශ්චිත පාසලක නිශ්චිත සේවා කාලයක් තිබීම.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2008.06.24 දිනැති පෙර සඳහන් ලිපියෙන් ගුරුවරුන්ගේ උසස්වීම්වලට අදාලව ඉහත සඳහන් පූර්ව අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර. එකී නිදහස් කිරීම් යටතේ 2008.06.30 දින දක්වා පමණක් පහත දක්වා ඇති පරිදි මෙම සහනයන් ක්‍රියාත්මක කර අදාල උසස්වීම් ලබා දීමට කටයුතු කරන ලෙස දන්වමි. මගේ අංක 2005/04 චක්‍රලේඛය මගින් පෙර සඳහන් අවශ්‍යතා විවිධ නියමයන්ට යටත්ව 2004.12.31 දින දක්වා නිදහස් කොට තිබුණි. ඒ අනුව මෙම චක්‍රලේඛය පරිදි ගුරුභවතුන්ට උසස්වීම් ලබා දිය යුතු දිනය 2005.01.02 දින හෝ ඊට පසු දිනයක් විය යුතු අතර 2008.07.01 දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

04. ශ්‍රී ලංකා පරිවේනාචාර්ය සේවය හා ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයද ශ්‍රී ලංකා ගුරු සේවයට සමාන හා සමාන්තර සේවා වන හෙයින් මෙම චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන එම සේවාවලටද යථා යෝග්‍ය වන පරිදි අදාළ කොටගෙන පරිවේනාචාර්යවරුන් සඳහා සහ පෞද්ගලික පාසල් ගුරුවරුන් සඳහාද අදාළ වන පරිදි උසස්වීම් ලබාදීමට කටයුතු කළ යුතුය.

05. ඉහත උසස්වීම් සිදු කිරීමෙන් අනතුරුව වැටුප් සකස් කළ යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2000 මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 5 වන වගන්තිය අනුවය. ඉහත උසස්වීම ලබාදීමේදී අවශ්‍ය වන අමතර ප්‍රතිපාදන ප්‍රමාණය ගණනය කොට ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

06. ඉහත දැක්වෙන උපදෙස් පරිදි ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස්වීම් ලැබීමට හිමිකම් ඇති සියලුම ගුරු භවතුන්ට උසස්වීම් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සලස්වන ලෙසද මෙම චක්‍රලේඛය අනුව පැනනගින යම් ගැටලුවක් වේනොත් ඒ පිළිබඳව මා විමසන ලෙසද වැඩිදුරටත් දන්වමි.

07. මීට අදාළව "ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස්වීම් ක්‍රියාත්මක කිරීම"යන මැයෙන් මා විසින් නිකුත් කරන ලද අංක: ඊඩී/2/29/10/21/31 හා 2008.10.20 දිනැති උපදෙස් ලිපිය එදින සිටම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන බවද කාරුණිකව දන්වමි.

එම්.එම්.එන්.ඩී බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

(1) ලේකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දැ.ගැ.ස. සහ අ.ක.ස

(2) පළාත් ප්‍රධාන ලේකම්වරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස

(3) පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත අ.ක.ස

(4) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස

(5) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස

(6) කොට්ඨාශ භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස